# 4

# අල්ලාහ්ගේ මැවුම්

දරුවනි! මිනිසා ඇතුළු අන් සියලු මැවුම් අල්ලාහ්ගේ මැවීම් බව පසුගිය පාඩමේ දී කියවුවා මතක ද?

අල්ලාහ්ගේ මැවීම් අතර පණ ඇති ඒවා පවතිනවා. මිනිසුන්, සතුන්, කුරුල්ලන්, කෘමීන්, ශාක සහ මත්ස්‍යයන් වැනි ඒවා පණ ඇති ඒවා ය. මේවා අතර ශාක වලට එහා මෙහා යා නොහැකිය.

කෘමීන්, ක්ෂුද්‍ර ජීවීන් හා බැක්ටීරියා ආදීන් අපගේ සැබෑ ඇසට නොපෙනෙන ඉතා කුඩා ජීවීන් ය.

පස, ජලය, ගින්දර, කඳු සහ ගංගා යනාදිය පණ නැති ඒවාය. සුළඟ, විදුලිය, තාපය, චුම්බකත්වය වැනි අල්ලාහ්ගේ මැවිම් වන ශක්තීන්ට ද පණ නැත.

අප ජීවත්වන පෘථිවියට එහායින් පිහිටි අල්ලාහ්ගේ මැවීම් වශයෙන් ඉර, හඳ, තාරකා, ග්‍රහලෝක යනාදිය සඳහන් කරන්න පුළුවන්. විශ්වයේ පවතින අල්ලාහ්ගේ අති විශාල මැවීම් වන මේවා චලනය වෙමින් පවතිනවා. එහෙත් ඒවාත් පණ ඇති ඒවා නො වේ.



ලෝකයේ පවතින පණ ඇති පණ නැති  හා විශ්වයේ පවතින අනෙක් අති විශාල මැවීම් සියල්ලම ද පුදුම ජනක ඒවා ය. තවද ඒවා මවා ඇත්තේ ද සැලසුම් සහගත ආකාරයට. ඒවා ක්‍රමවත් ආකාරයට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. එමගින් ඒවා මවා ඇත්තේ  දැනුම සහ ශක්තිය ඇති අල්ලාහ් විසින් බව අපට මනාව පැහැදිලි වෙනවා නේ ද?

දරුවනි! අපගේ ඉන්ද්‍රින්ට ගෝචරයට නොවන  පිහිටන තවත් ලොවක් ද තිබෙන වා. එහි අල්ලාහ්ගේ මැවුම්  පවති. එයින් මැලක්වරුන් ප්‍රධාන ය. අල්ලාහ් විශ්වාස කරන මුඃමින්වරුන් ඔහුගේ මැලක්වරුන් ගැන ද විශ්වාස කළ යුතුයි. මේ ගැන අල්කුර්ආනය පහත සඳහන් ආකාරයට පවසයි.

"විශ්වාසවන්තයෝ සියල්ලෝම අල්ලාහ් සහ ඔහුගේ මැලක්වරුන් ඔහුගේ ආගම් සහ ඔහුගේ වක්තෘන්වරුන් ගැන විශ්වාස කරති. (2:285)"

අල්ලාහ් පළමු මිනිසා වන ආදම් (අලයි) පසෙන් මැව්වේ ය. එහෙත් මැලක්වරුන් මවනු ලැබුවේ ආලෝකයෙන් ය. මැලක්වරු පිරිමි හෝ ගැහැනු හෝ නොවෙති. ඔවුනට දෙමාපියන් හෝ  දරුවන් හෝ නොමැත. මිනිසුනට මෙන් බඩගින්න, පිපාසය, ආශාවන්, වෙහෙස, නින්ද, වයසට යෑම හෝ  දුබලවීම ආදිය ඔවුනට නැත. එසේම ඔවුනට දේවත්වයක් ද නැත. ඔවුහු අල්ලාහ් විසින් පනවන ලද වගකීම් පැහැර නොහැර ඉටු කරති. ඔවුහූ අසංඛ්‍යාත්මක වෙති.

මැලක්වරුන්ගේ  සංඛ්‍යාව දන්නේ අල්ලාහ් පමණි. ඔවුන්ගේ සංඛ්‍යාව අති විශාල ය. ඔවුනතුරෙන් වැදගත් අය දස දෙනෙකි. මැලක්වරුන් අතරින් ජිබ්රීල් (අලයි) ඉතා වැදගත් කෙනෙකි. අල්ලාහ්ගෙන්  නබිවරුන් වෙත පණිවිඩ ගෙන එන්නේ ඔහුය.  අර්රූහ්, නාමූසුල් අහ්ලම්, සහ රූහුල් කුද්ස් යන සුවිශේෂ නම් ද ඔහුට ඇත.

මීක්කායීල් (අලයි) යන මැලක්වරයා සුළඟ, ජලය, ගින්න, වැනි ඒවා බාරව කටයුතු කරයි. ඉස්රාෆීල් (අලයි) කියාමා දිනය ළඟාවන විට සූර් පිඹියි. මලකුල් මව්ත් (අලයි) ප්‍රාණය  අත්පත් කරයි. රකීබ්, අතීද් (අලයි) දෙදෙනා මිනිසා කරන හොඳ නරක සටහන් කරති. මුන්කර්, නකීර් (අලයි) දෙදෙනා කබ්ර් හි ප්‍රශ්න කරති. රිල් වාන් (අලයි) ස්වර්ගයේ අධිපතියා ය. මාලික් (අලයි) නිරයේ අධිපතියා ය.

අපගේ ඉන්ද්‍රියන්ට ගෝචර නොවන ආකාරයේ අල්ලාහ් ගේ මැවුම් අතර තවත් කොටසක් ද වෙති. ඔවුහූ ජින්වරු නම් වෙති. ඔවුහූ ගින්නෙන් මවනු ලැබූ  අය වෙති. මිනිසුන්ට මෙන් මොවුන්ට ද කුසගින්න, පිපාසය, නින්ද, ආශාවන් හා පවුල් ආදිය ඇත. මිනිසුන් මෙන් ජින්වරු ද අල්ලාහ් නැමැදීමටත් ඔහුට කීකරු වීමටත්  අණ කරනු ලැබ සිටිති.

ජින්වරුන් අතර අල්ලාහ්ට අකීකරු කොටස ෂයිතාන්වරු ය. නොයෙකුත් ආකාරයේ නොසන්සුන් බව ඇති කරන ෂයිතාන්වරුන්ගේ නායකයා ඉබ්ලීස් ය.

දරුවනි, අල්ලාහ් ගේ මැවුම් පුදුම එලවනසුලු එකක් බව ඔබට වැටහෙනවා ඇත. මෙම කරුණුවලින් පෙන්වා දෙන ආකාරයට සියල්ලෙහි ම මැවුම්කරුවා, සර්ව බලධාරියා අල්ලාහ් බව අපි විශ්වාස කරන්නෙමු.

අභ්‍යාසය

1. අල්ලාහ්ගේ අතිමහත් මැවීම් දෙකක් නම් කරන්න
2. ආදම් (අලයි) තුමා මවනු ලැබුවේ කුමකින් ද?
3. ජිබ්රීල් (අලයි) තුමාගේ සුවිශේෂ නම් දෙකක් ලියන්න.
4. මිනිසුන් හා මැලක්වරුන් අතර වෙනස්කම් වගු ගත කරන්න.
5. අල්ලාහ්ගේ ආශ්චර්යයන් දකිනවිට අපගේ සිතෙහි ඇති වූ හැඟීම් ලැයිස්තු ගත කරන්න.
6. ජින්වරුන් පිළිබඳව ඔබ දැනගත් කරුණු කෙටියෙන් ලියන්න.
7. ප්‍රධාන මැලක්වරුන්ගේ නම් සඳහන් කරන්න.